**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-11-29

පැමිණිලි පාර්ශවය : ආර්.පී.ඩී.එස්.කේ රාජපක්ෂ මිය,
අංක 20, ආනන්ද පාර,
මොරටුමුල්ල, මොරටුව.

වගඋත්තර පාර්ශවය :
1. සාමාන්‍යාධිකාරී,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

2. කළමණාකරු,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

__පැමිණිලි අංකය : HRC/3743/17, HRC/867/17__

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකාරිය විසින් 2017.03.03 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ III වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට තුන් වතාවක් පෙනී සිටි නමුත් මෙම උසස්වීම් සඳහා සියළුම සුදුසුකම් සපුරා තිබියදී උසස්වීම් නොලැබුනු බවයි. 2016.06.02 දින නිකුත් කර ඇති සේවා ඇගයීම් වෙනුවෙන් ලැබිය යුතු ලකුණු 05 ක ප්‍රමාණය උසස්වීම් චක්‍රලේඛ අංක 615/2005 හි සඳහන් වී ඇති පරිදි මෙම ලකුණු ලබා නොදීම හේතුවෙන් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි.

පැමිණිලිකාරිය පැමිණිල්ලේ තවදුරටත් සඳහන් කර ඇත්තේ, පහත නම් සඳහන් අයවලුන් තමාට වඩා අඩු සුදුසුකම් ඇති අය බවත්, එසේ තිබියදී ඔවුන් හට උසස්වීම් ලබා දී ඇති බවත්ය.

1. ජී.ඩී.එම්.ටී අබේසේකර
2. එස්.ඩී.එස්.ඩී පෙරේරා
3. තුසිත දිසානායක
4. එස්.ටී.බී.එස් පෙරේරා,
5. ජී.ඩී.එම්.බී අබේසේකර
6. ටී. දිසානායක

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் – 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் – 011-2505451
ෆැක්ස් / தொலைநகல் – 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் – sechrcsl@gmail.com

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

ජාතික ඉතිරිකිරීමේ බැංකුව III(ii) ශ්‍රේණියේ සිට III(i) ශ්‍රේණියට උසස්වීම සඳහා 2016 වර්ෂයේ නොවැම්බර් මස පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටියද කළමණාකාරීත්වය විසින් ගනු ලැබූ තීරණයට අනුව 2016.09.20 වන දින ප්‍රකාශයට පත් කරන ලද වැ.බ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන) ලිපි අංක 08/2016 මගින් සාමාන්‍යාධිකාරි චක්‍රලේඛ අංක 615/2006 දරණ උසස් කිරීමේ පටිපාටියට අනුව III(i) උසස්වීම් ලබාදීම සඳහා III(ii) ශ්‍රේණියේ එක් වසරක් සම්පූර්ණ කරන ලද සේවා නියුක්තිකයන්ගේ අයදුම්පතක් කැඳවන ලද බවත්,පැමිණිලිකාරිය මේ සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා තිබීම නිසා සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීමට අවස්ථාව ලබාදුන් බවයි.

ඒ අනුව අයදුම්කාරියගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සේවා කාලය ක්‍රියාකාරිත්වය ඇගයීම් සඳහා පැමිණිලිකාරිය විසින් ලබා ගන්නා ලද පෞරුෂත්වය, සන්නිවේදන හැකියාව, නායකත්ව හැකියාවන් විෂය පිළිබඳ  දැනුම යන කෂේත්‍ර ඇගයීමකට ලක් කර පැමිණිලිකාරිය වෙත ලකුණු ලබාදීමට කටයුතු කර ඇති බවයි.

සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල 2017.02.08 වන දින බැංකුවේ අභ්‍යන්තර ජාලය හරහා සාමාන්‍යාධිකාරි චක්‍රලේඛ අංක 1777/17 මගින් ප්‍රකාශයට පත් කල බවත් එහිදි ආර්.පි.ඩි.එස්.කේ. රාජපක්ෂ මිය හට සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම නිසා උසස්වීම් ලැබී නොමැති බවයි.

<u>පරීක්ෂණයේදි අනාවරණය වූ කරුණු</u>

පැමිණිලිකාරිය කොමිෂන් සභාව වෙත වාචික හා ලිඛිත දේශන ලබා දීමෙන් ප්‍රකාශ කරනු ලබන්නේ ඉහත නම් සඳහන් අයවලුන් තමාට වඩා අඩු සුදුසුකම් ලබා ඇති නමුත් සම්මුඛ පරීක්ෂණය කරන සම්මුඛ පරීක්ෂණ මඩුල්ල (ත්‍රිපුද්ගල) තමාට සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු 30 ක ප්‍රමාණයක් ලබාදීමේදි අසාධාරණයක් සිදුවී ඇතිද යන්න ලේඛන හා දත්තයන් මත වාර්තා ලබා ගනිමින් කල පරීක්ෂණයේදි හඳුනාගත් කරුණු මත පැමිණිලකාරිය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින විට සම්මුඛ පරීක්ෂණ මඩුල්ලේ දෙදෙනෙකු පමණක් සිටි බවත් එසේ තිබියදි තුන්දෙනෙකු විසින් ලකුණු 5,4,3, යන ආකාරයට ලකුණු ලබා දුන්නේ කෙසේද යන්න ප්‍රශ්න කරන අතර එය සනාථ කිරීම සඳහා කොමිසම විසින් කල පරීක්ෂණයේදි අනාවරණය කර ගැනීමට ප්‍රමාණවත් කරුණු හා සාක්ෂි නොමැත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 30 ප්‍රමාණයක් ලබා දිමට ක්‍රියා කර ඇති ආකාරය හා පදනම මෙන්ම නිර්ණායකයන් පිළිබඳව වගඋත්තරපාර්ශවය කොමිෂමට නිසි පරිදි ලකුණු ලබාදුන් එක් එක් සම්මඛ පරීක්ෂණ නිලධාරින්ගේ ලකුණු පිළිබඳව දත්ත ලේඛන කොමිෂමට ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයවලුන්ගේ ලකුණු ලබාදුන් පොදු ලේඛනයක් පමණක් සතුව ඇති බවත්,එබැවින් එම පොදු ලේඛනය පමණක් කොමිෂමට ඉදිරිපත් කල අතර ඒ තුලින් නිසි පැහැදිලිවීමක් නොමැත. පැමිණිලිකාරිය විසින් අභියෝගයට ලක් කරන ලද සෙසු අයදුම්කරුවන් හයදෙනාට ලකුණු ලබා දීම පිළිබඳව දත්ත විශ්ලේෂණ නිසි පැහැදිලි කිරීමක් හෝ ලේඛන යොදා ගත් ආකාරය පිළිබඳව පැහැදිලිවීමක් නොමැත. එයට අදාල දත්ත ලේඛනද කොමිෂන්  සභාව ඉදිරියේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. පැමිණිලිකාරිය සහාකාර කළමනාකාරිණියක් ලෙස i ශ්‍රේණියේ ශාඛාවක් වන මොරටුව ශාඛාවේ සේවය කර ඇති බව අනාවරණය වේ.පැමිණිලිකාරිය තුන්වතාවක් III(i) ශ්‍රේණියට උසස්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ඇති බව අනාවරණය වේ.

වගඋත්තර පාර්ශවය විසින් 2018.01.08 වන දින කොමිෂන් සභාවට ලබාදි ඇති ලිපියට අනුව පැමිණිලිකාරියගේ සේවය ඇගයීමේ ලිපියට ලකුණු ලබා දි නොමැති බව සඳහන් කර ඇතද, එයට 2018.01.08 දිනැති සාමාන්‍යාධිකාරි /ප්‍රධාන විධායක නිලධාරි කොමිසමට සඳහන් කර ඇත්තේ ලකුණු ලබාදීමට නම් සභාපතිතුමාගේ හෝ සාමාන්‍යාධිකාරි තුමාගේ අත්සනින් නිකුත් කරන ලද ප්‍රශංසනාත්මක ලිපි සඳහා පමණක් බවයි. එනමුත් පැමිණිලිකාරියට සේවය ඇගයීමේ ලිපිය 2016.06.02 වන දින ලබා දී ඇත්තේ ප්‍රධාන කළමණාකරු (සේවක මණ්ඩල) විසිනි. මෙහිදි පැමිණිලිකාරිය හට අසාධාරණයක් සිදුවී ඇති බව පැහැදිලි වේ. එයට හේතු සාධක වන්නේ ප්‍රධාන කළාමණාකරු විසින් සේවය ඇගයීමේ ලිපිය නිකුත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වන සභාපතිතුමාගේ හෝ සාමාන්‍යාධිකාරිවරයාගේ අවසරය ලබාගෙන සේවා සහතිකය නිකුත් කර ඇති බව අනිවාර්ය කරුණක් වන හෙයින් ඒ සඳහා පැමිණිලිකාරි හට සම්මුඛ පරීක්ෂණයේදි එයට ලකුණු ලබා නොදීම සාධාරණ කරුණක් නොවන

බව අනාවරණය වේ. පැමිණිලිකාරිය වසර 37 ක සේවා කාලයක් සපුරා ඇති අතර එම කාලය තුලදී වැඩ බලන සාමාන්‍යාධිකාරිවරියක් ලෙස කටයුතු කර තිබියදී එයට පසුව බැඳුණු අයවලුන් සඳහා උසස්වීම් ලබාදී ඇති බව කොමිෂන් සභාව පරීක්ෂණයේදී ලිඛිත දේශන ලබාදුන් අතර එය නිශ්ප්‍රභා කිරීමට වගඋත්තර පාර්ශවය අපොහොසත් විය.

<u>නිගමනය</u>

ඉහත කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරියට වඩා පසුව සේවයට බැඳුනු අයවලුන්හට සම්මුඛ පරීක්ෂණයේදී ලබාදුන් ලකුණු පිළිබඳව පැහැදිලි ලේඛන ඉදිරිපත් නොවන බැවින්ද පැමිණිලිකාරිය සඳහා උසස්වීමට අදාල සුදුසුකම් සඳහාද ලකුණු ලැබී නොමැති බැවින් ද පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවී ඇති බව පෙනී යයි. එබැවින් පැමිණිලිකාරිය විශ්‍රාම ගොස් සිටින බැවින් III(i) ශ්‍රේණියට 2015.04.01 වන දිනට පසුදාතම් කර හිඟ වැටුප් සහිතව උසස්වීම ලබාදීම සුදුසු වේ.

<u>නිර්දේශය</u>

පැමිණිලිකාරියගේ උසස්වීම හා අදාළ වැටුප් පෙරදාතම් කරමින් හිඟ වැටුප් සහිතව උසස්වීම ලබාදීමට කටයුතු කරන ලෙසට වගඋත්තරකාර පාර්ශවයට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

මෙම නිර්දේශය අනුව කටයුතු කර 2022. 12 . 30 වන දිනට පෙර වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

M.H. Nimal K...
Commission...
...Rights Commis...